# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013
(නව නිර්දේශය)
2016 අගෝස්තු - ඔක්තෝබර්

සමාජීයවිද්‍යා පීඨය

භූගෝලවිද්‍යාව - GEOG - E 3025

ආර්ථික භූගෝලවිද්‍යාව

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. ආර්ථික භූගෝලවිද්‍යා විෂය ක්ෂේත්‍රය සහ එය අධ්‍යයනය කිරීමේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

02. "ප්‍රාථමික, ද්විතියික හා තෘතියික ආර්ථික කටයුතු සෑමවිටම එකිනෙක හා සම්බන්ධවෙමින් ක්‍රියාත්මක වේ." මානව ආර්ථික කටයුතුවල අවකාශීය ව්‍යාප්තිය හඳුනාගනිමින් මෙම අදහස පැහැදිලි කරන්න.

03. තෝරාගත් එක් ලෝක කෘෂිකාර්මික වර්ගීකරණයක් භාවිතා කරමින් ප්‍රාථමික ආර්ථික කටයුතුවල විවිධතා කෙරෙහි බලපා ඇති හේතු සාධක සාකච්ඡා කරන්න.

04. ලෝකයේ බැර කර්මාන්ත ස්ථානගතවීම කෙරෙහි පවතින තාර්කික පදනම හඳුනා ගැනීම සඳහා 'ඇල්ෆ්‍රඩ් වෙබර්' (Alfred Weber) ඉදිරිපත් කළ කර්මාන්ත ස්ථානගතවීම පිළිබඳ ආකෘතිය පදනම් කරගත හැකි ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

05. ලෝකයේ ස්වාභාවික සම්පත් හිමිකම ආශ්‍රිතව පැනනැගී ඇති ගැටලු ආර්ථික කටයුතුවල ස්ථාවරභාවය කෙරෙහි බලපා ඇති ආකාරය පරීක්ෂා කරන්න.

06. ආර්ථික ප්‍රදේශ අතර අන්තර් සම්බන්ධතා ගොඩනැගීම කෙරෙහි ප්‍රවාහන සේවා මාධ්‍ය බලපා ඇති ආකාරය පැහැදිලි කරන්න.

07. ආර්ථික කටයුතු සම්බන්ධයෙන් පවතින අවකාශීය වෙනස්කම් සහ නූතන ජාත්‍යන්තර වෙළඳ රටා අතර පවතින සම්බන්ධතාවය විමර්ශනය කරන්න.

08. ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් පහත මාතෘකාවලින් දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

    i. චාතුර්ථික හා පශ්චිම ආර්ථික කටයුතු
    ii. ප්‍රාදේශීය ආර්ථිකයන්
    iii. සියුම් පාරිභෝගික කෘෂිකර්මය ආශ්‍රිත ගැටලු
    iv. කාර්මික ජනපද

*******************